EDB
SRI LANKA

# අපනයන පුවත්

මාසික තොරතුරු ප්‍රකාශනය

01 වෙළුම 01 කලාපය
2023 මැයි

කාබනික නිෂ්පාදන ප්‍රවර්ධනයට සන්නාම සළකුණක් 03

අපනයනයේ අගය එක්කරන්නේ මෙහෙමයි 05

අපනයන සිහිනය ජයගැනීමට මහගු අවස්ථාවක් 07

විදෙස් ගැනුම්කරුවෙකු සොයාගන්න 09





SRI LANKA CERTIFIED ORGANIC




ප්‍රකාශනය :

අපනයන පුවත් ර් - මාසික තොරතුරු ප්‍රකාශනය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රකාශනයකි

මගපෙන්වීම :

ආචාර්ය කිංස්ලි බර්නාඩ්
මාලනී බද්දේගමගේ
අචිනි වීරවර්ධන

සංස්කාරක මණ්ඩලය :

උපුල් ගලප්පත්ති
නාලක මධුෂාන්
චන්දිම වන්නිආරච්චි
කේ.ඩී.දර්ශන

පිටු සැකසුම :

චන්දිම දොළපිහිල්ල

බෙදාහැරීම :

වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු අංශය

0112 300 724








# ලොව ජයගන්න හැටි දැනගන්න

ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ අභියෝග රැසකට පසුගිය සමයේ මුහුණ දුන්නේය. මේ වන විට අප ඒ අති දුෂ්කර කාල සීමාව පසුකර බලාපොරොත්තු තැබිය හැකි අනාගතයකට ප්‍රවේශ වෙමින් සිටින්නේමු.

එහිදී රටේ ආර්ථිකය නැංවීමේ පළමු අභියෝගය රටට වැඩි වැඩියෙන් විදේශ විනිමය ගෙන එම බව අමුතුවෙන් කිව යුතු නොවන්නේය. එහිදී වැඩිම කාර්ය භාරයක් පැවරෙන්නේ අපනයන ක්ෂේත්‍රය වෙතටය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය භාරය වී ඇත්තේ ඒ සඳහා සක්‍රියව මැදිහත් වීමය.

රටේ විදේශ විනිමය සංචිත ඉහළ නැංවීමට නම් දැනට සිදුකෙරෙන මෙරට අපනයන නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට අතිරේකව නව අපනයන කරුවන් ජනිත කිරීම හරහා වැඩි අපනයන ඉලක්කයක් සපුරා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් වන්නේය.

අපනයන තත්වයට ගෙන යා හැකි ව්‍යවසායකයින් රැසක් මෙරට පුරා විසිරී ඇති බව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මේ වන විටත් හඳුනාගෙන ඇත්තේය. ඔවුන්ගේ නිෂ්පාදන වල ගුණාත්මක බව, තත්වය, ඇසුරුම්කරණය ඉහළ නැංවීම මගින් මෙන්ම ජාත්‍යන්තර වෙළඳ පොළට පිවිසීමේදී දැනුවත් විය යුතු කරුණු, නව වෙළඳ පොළවල් හඳුන්වා දීම මෙන්ම, නිෂ්පාදන අගය වැඩිකිරීමේ ක්‍රමවේද පිළිබඳවද ව්‍යවසායකයින් දැනුවත් කිරීම මෙහිදී කළ යුතුම දෙයක්ය.

අපනයන පුවත් මාසික තොරතුරු ප්‍රකාශනය හරහා අප උත්සාහ කරන්නේ එම අරමුණු සාක්ෂාත් කර ගැනීමය.

සංස්කාරක මණ්ඩලය

## කාබනික ආහාර වල ගුණාත්මක බව වැඩිකිරීමට හා ප්‍රමිතිකරණයට

# ජාතික කාබනික සහතික කිරීමේ සලකුණක්



ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ, ජාතික කාබනික පාලන ඒකකය විසින් ජාතික කාබනික සහතික කිරීමේ සලකුණක් හඳුන්වා දී ඇත්තේය. මෙහි අරමුණ වන්නේ "කාබනික ආහාර වල ගුණාත්මක භාවය සහ ප්‍රමිති කරණය සහතික කිරීමය". එමෙන්ම එම ආහාර මිළදී ගන්නා පාරිභෝගිකයන් අතර විශ්වාස නීයත්වය වර්ධනය කිරීමද මෙමගින් සිදු වන්නේය මෙම කරුණු අනාවරණය කෙරුණේ පසුගිය අප්‍රේල් 28 වැනිදා කොළඹ ගාලු මුවදොර හෝටල යේදී පැවැති ජාතික කාබනික සහතික කිරීමේ සලකුණ (National Organic Certification Mark - OCM) එළිදැක්වීමේ උළෙලේදීය.



යුරෝපා සංගමය (EU) සහ ජර්මනියේ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශයේ (BMZ) මූල්‍යමය දායකත්වය හා සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක කෙරෙන මෙය "ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) ජාතික කාබනික පාලන ඒකකය (NOCU) විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේය".

දේශීය කාබනික ආහාර නිෂ්පාදකයින් හා අපනයනකරුවන්ට සිය නිෂ්පාදන ප්‍රවර්ධනයේදී මෙම සලකුණ යොදාගැනීමට අවස්ථාව හිමිවන අතර "ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාබනික පාලන ඒකකය ඇමතීමෙන් ඒ සඳහා අයදුම් කළ හැකිය".

"ජාතික කාබනික ප්‍රමිතිය (NOS) SLS 1324:2018 ප්‍රකාරව සහතික කරන ලද නිෂ්පාදන සඳහා මෙම ලකුණ හරහා නිසි පිළිගැනීමක් සහ වෙළඳපොළ වාසියක ලැබෙන බවට අපනයන සංවර්ධන මණ්ඩලය සහතික





වෙනවා". කාබනික සලකුණ එළිදැක්වීමේ අවස්ථාවට එක්වෙමින් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති ආචාර්ය කිංස්ලි බර්නාඩ් මහතා එසේ පැවසූ අතර ඔහු තවදුරටත් කියා සිටියේ මෙරට කාබනික නිෂ්පාදන මිළදී ගන්නා පාරිභෝගිකයන් ඉතා ඉක්මනින් මෙම සලකුණට හුරුපුරුදු වනු ඇති බවය. තවද එසේ හුරුවීම හේතුවෙන් වෙළඳ පොළේ ඇති උසස් තත්වයේ කාබනික නිෂ්පාදන පහසුවෙන් හඳුනා ගැනීමට එය රුකුළක් වනු ඇතැයිද හෙතෙම විශ්වාසය පළ කළේය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල



(EDB) පනත යටතේ 2014 දී පිහිටවූ ජාතික කාබනික පාලන ඒකකය (NOCU) මින් අනතුරුව ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන සම්බන්ධ සියලු කටයුතු අධීක්ෂණය කරනු ඇත්තේය. එහි අවසරය යටතේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 2018 දී ජාතික කාබනික ප්‍රමිතිය (NOS ) SLS 1324:2018 සංශෝධනය කරන ලද්දේය.

ජාතික කාබනික ප්‍රමිතිය මගින් දිවයිනේ කාබනික නිෂ්පාදන සහ නිෂ්පාදන ක්‍රියාවලිය, වනාන්තර වලින් නෙලාගන්නා අස්වැන්න, පසු අස්වනු හැසිරවීම, ගබඩා කිරීම, සැකසීම, ප්‍රවාහනය, ඇසුරුම් කිරීම, ලේබල් කිරීම සහ අලෙවි කිරීම සඳහා නිර්දේශ නියාමනය කරන්නේය.

උසස් තත්වයේ කාබනික නිෂ්පාදන පාරිභෝගිකයින්ට ලබා දීමේදී මෙම ප්‍රමිතිය අනුගමනය කිරීමට ගොවීන් සහ නිෂ්පාදකයින් දිරිමත් කරනු ඇති අතර ජාතික කාබනික සහතික කිරීමේ ලකුණ (NOCM) පාරිභෝගිකයින් සහ මහජනතාව අතර ජාතික කාබනික ප්‍රමිතියෙහි (NOS) අවශ්‍යතා තෘප්තිමත් කරන කාබනික නිෂ්පාදන සඳහා පිළිගැනීම වැඩි දියුණු කිරීමට සහ සත්‍යාපනය

*" දේශීය කාබනික ආහාර නිෂ්පාදකයින් හා අපනයනකරුවන්ට සිය නිෂ්පාදන ප්‍රවර්ධනයේදී මෙම සලකුණ යොදාගැනීමට අවස්ථාව හිමිවන අතර, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාබනික පාලන ඒකකය ඇමතීමෙන් ඒ සඳහා අයදුම් කළ හැකිය"*



# අගය එකතු කළාම අගය වැඩිවෙයි .... අගය වැඩි වුණාම ආදායම වැඩිවෙයි ....




ශ්‍රී ලංකාව වර්ග ප්‍රමාණයෙන් කුඩා රටක්ය. එබැවින් යම් වගාවක් හෝ නිෂ්පාදනයක් සිදුකිරීමේ උපරිම සීමා අපට ඇත්තේය. සරළ උදාහරණයකින් කිවහොත් ලොව කොතරම් ඉල්ලුමක් තිබුණද මෙරට තුළ කුරුඳු වගා කළ හැකි නිශ්චිත භූමි ප්‍රමාණයක් ඇත්තේය. අක්කර දහස් ගණනින් කුරුඳු වගාවට යෙදවිය නොහැක්කේ භූමිය සීමා සහිත වීම නිසාය. එබැවින් කුරුඳු නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා වැඩි භූමි ප්‍රමාණයක වගාව ව්‍යාප්ත කිරීම කළ නොහැක්කේය. ඒ අනුව නිෂ්පාදනය වැඩි කිරීම වෙනුවට කළ හැකි අනෙක් ක්‍රමය වන්නේ භූමියෙන් ලබාගන්නා ඵලදාව වැඩි කර ගැනීමය. එහෙත් මේ වන විට ඒකක වර්ග ප්‍රමාණයකින් ලබා ගන්නා නිෂ්පාදනය උපරිමයෙන් ලබාගන්නා හෙයින් වෙනත් විකල්ප ක්‍රම වෙත ගමන් කිරීමට අපට සිදුවන්නේය.

ඒ සඳහා ගත හැකි හොඳම විකල්ප පියවර වන්නේ අප විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමය.

ජාත්‍යන්තර වෙළඳපොළ තුළ සුවිශේෂී නමක් දිනා ඇති කුරුඳුම උදාහරණයක් වශයෙන් ගත්තද එහි අගය එක්කළ නිෂ්පාදන රැසක් සඳහා මේ වන විටත් ජාත්‍යන්තර වෙළඳ පොළ තුළ හොඳ ඉල්ලුමක් ගොඩනැගී ඇත්තේය. අමුද්‍රව්‍ය ලෙස කුරුඳු අපනයනයට වඩා සිලෝන් සිනමන් සන්නාමය යටතේ නිපදවෙන විවිධ අගය එකතු කළ නිපැයුම් මගින් වැඩි ආදායමක් ලබාගැනීමට හැකියාව ඇත්තේය. කුරුඳු කුඩු, කුරුඳු කොළ, තෙල්, කඳෙන් නිස්සාරණය කරගන්නා තෙල්, කුරුඳු මුඛ සේදුම් දියර, දත් බෙහෙත්, දැහැටි කූරු වැනි කුරුඳු වල අගය එකතු කළ නිෂ්පාදන ඊට උදාහරණය. මෙහිදී පවතින ජාත්‍යන්තර වෙළඳපොළ රැක ගන්නා අතරම නව වෙළඳපොළවල් වෙත ප්‍රවිෂ්ට විය යුත්තේය. මෙහිදී නිෂ්පාදනකට අගය එකතු කිරීම හරහා ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම කළ හැක්කේය.




භාණ්ඩයක් හෝ සේවාවක පවතින සාමාන්‍ය වටිනාකමට අමතරව ඉහළ ගිය අමතර වටිනාකමක් එක්කිරීම තුළින් ඒ භාණ්ඩය පරිභෝජනය කිරීමේ දී පාරිභෝගිකයාගේ යම්කිසි තෘප්තියක් ළඟා කර ගත හැකිවීම භාණ්ඩවලට වටිනාකම් එකතු කිරීම ලෙස සරලවම පැහැදිලි කළ හැකිය. අගය එකතු කිරීම භාණ්ඩයකට පමණක් සීමා නොවන අතර එය කිසියම් සේවාවකට යොදා ගත හැකිය. භාණ්ඩයක හෝ සේවාවක අගය එකතු කිරීම ආකාර කිහිපයකින්ම සිදුකළ හැකිය. ශක්තිමත් වෙළඳ නාම නිර්මාණය කරන සමාගම් ඕනෑම නිෂ්පාදනයක් සඳහා ඔවුන්ගේ ලාංඡනය එක් කිරීමෙන් පමණක් අගය එකතු කරයි. නයික් ඉන්කෝපරේටඩ් සපත්තු වෙනත් සපත්තු නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන වලට වඩා වැඩි මිලකට අලෙවි කරයි. ඒ ඔවුන්ගේ සන්නාමය පාරිභෝගිකයන් අතර ප්‍රචලිත කිරීම හරහාය. නයික් සපත්තු මිළ වැඩි වුවද එහි නිෂ්පාදන පිරිවැය සෙසු නිෂ්පාදකයන්ගේ නිමැවුම් වලට සමානය.

අගය එකතු කිරීමේදී රටක ආහාර සුරක්ෂිතතාවයක් ඇති කළ හැකියි. කල්

තබාගැනීම හරහා හිඟයකින් තොරව වසරේ ඒකාකාරීව ආහාර නිෂ්පාදන පාරිභෝගි කයන් අතට පත් කළ හැකිය. එමෙන්ම කල් තබා ගන්නා ආහාරවල ප්‍රෝටීන් සහ ඛනිජ ලවණ සුරක්ෂිතව තිබෙන නිසා ආහාරවල පෝෂණ ගුණය ඉහළ මට්ටමකින් රඳවා තබාගැනීමේ හැකියාව මෙන්ම පාරිභෝගික විශ්වාසය ද රැක ගත හැකිය. නිෂ්පාදනය කට අගය එකතු කිරීමට පෙර ව්‍යවසායක යෙකු විසින් සැලකිල්ල යොමු කළ යුතු කරුණු කිහිපයක්ද වන්නේය. පරිභෝජනය කිරීමේදී පාරිභෝගිකයාට ඇති පහසුව, භාණ්ඩයට සන්නාමයක් පැවතිය යුතු වීම, ගුණාත්මක භාවය, භාණ්ඩයේ ඇසුරුම්කරණය ගැන ද අවධානය යොමු කළ යුතුය.

කෘෂිකාර්මික නිෂ්පාදනයක් හෝ ඕනෑම නිෂ්පාදනයක් සඳහා විවිධ අදියරවලදී විවිධ මට්ටමින් අගය එකතු කිරීම සිදුකළ හැකිය. උදාහරණයක් ලෙස ගම්මිරිස් නිෂ්පාදකයෙක් ගතහොත් බොහෝ දෙනා සිදුකරන්නේ එම අස්වැන්න නෙලාගෙන එවා තොග ගැණුම්කරුවෙකු වෙත අලෙවි කිරීමය. මෙහිදී ලැබෙන ලාභය සාමාන්‍ය වෙළඳ පොළ වටිනාකම පමණය. ඒ වෙනුවට නෙලා ගන්නා ගම්මිරිස් නිසි ප්‍රමිතියට වියළීම හා සැකසීමෙන් අනතුරුව ප්‍රමිතිගතව ඇසුරුම් කොට අපනයනය කරන අවසථාද දක්නට ඇත්තේය. මෙමගින් මුල් අවස්ථාවට වඩා වැඩි ලාභයක් ලබාගැනීමට හැකියාව පවතින්නේය.

එසේත් නොමැති නම් ගම්මිරිස් අමුද්‍රව්‍ය ලෙස අලෙවි කිරීම හෝ අපනයනය කිරීම වෙනුවට එවායින් තෙල් නිස්සාරණය කර වෙළඳ පොලට නිකුත් කිරීමෙන් පෙර අවස්ථා දෙකටම වඩා තුන් හතර ගුණයක වැඩි වටිනාකමක් ලබාගත හැකිය. යම් නිෂ්පාදනයක් හෝ සේවාවක් ඉතා අඩු මහන්සියකින් අපනයනයකර සුළු ලාභයක් උපයා ගන්නේද, එසේ නොමැතිව අගය එකතු කොට දෙතුන් ගුණයක ආදායමක් ලබා ගන්නවාද යන්න ඔබ තීරණය කළ යුතුය.

කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය අතරතුර ඒ සඳහා අගය එකතු කළ හැකි ප්‍රධානම අවස්ථා ලෙස ඇසුරුම්කරණය සහ ලේබල්කරණය හඳුන්වා දිය හැකිය. පිටත පෙනුම ආකර්ශණීය අයුරින් ඇසුරුම් කිරීමෙන් ගැනුම්කරුවාගේ ආකර්ශනය සැනෙකින් යොමුකර ගැනීමට හැකිය. නිෂ්පාදනයකට අගය එකතු කිරීමේදී ඇසුරුම්කරණය වැදගත් කාර්යයභාර්‍ය යක් ඉටුකරණු ලබන්නේ එනිසාය. එසේම භාණ්ඩයක ලේබල්කරණය තුළින් නිෂ්පාදනයේ වටිනාකම සහ ගුණාත්මය පූර්ණ වශයෙන් පාරිභෝගිකයා වෙත සන්නිවේදනය කළ හැකිය.

තවද තත්ව සහතික හරහාද නිෂ්පාදනය කට අගය එකතු කිරීමක් කළ හැකිය. උදාහරණයක් ලෙස කාබනික නිෂ්පාදන මිලදී ගැනීමට යුරෝපීය ජාතිකයන් වැඩි උනන්දුවක් දක්වන බැවින් යුරෝපයට කිසියම් නිෂ්පාදනයක් යැවීමේදී කාබනික තත්ව සහතික පිළිබඳවද වැඩි අවධානයක් යොමුකිරීම වැදගත්ය. ඒ අනුව කාබනික සහතිකකරණයෙන් නිෂ්පාදනයකට අගය එකතු කිරීමක් කළ හැකිය.






ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සංවිධානය කරනු ලබන 'EDB Open Day' වැඩසටහන ජුනි මස 15 වැනි දින පැවැත්වීමට කටයුතු යොදා ඇත්තේය. අපනයන මට්ටමේ ව්‍යවසායකයන් සවිබල ගැන්වීම සඳහා වූ මෙම වැඩසටහන පවත්වෙන්නේ කොළඹ 02, නවම් මාවතේ, අංක 42 දරණ ස්ථානයේ EDB/NDB Tower හි පිහිටි එම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේදීය. වැඩසටහන එදින පෙරවරු 9.30 සිට සවස 4.30 දක්වා පැවැත්වෙන්නේය.

දේශීය ව්‍යවසායකයන් අපනයන මට්ටමට රැගෙන එමේදී ඔවුන් මුහුණ දෙන ප්‍රශ්ණ සහ ගැටලු සඳහා උපදේශන සේවා ලබා දීමත්ණී නව අදහස් හඳුනා ගනිමින් ඒවා එළිදැක්වීමට හා ප්‍රවර්ධනයට අවශ්‍ය රාජ්‍ය සහාය ලබාදීමත් වෙනුවෙන් මෙම එක්දින වැඩසටහනක් සංවිධානය කර ඇත්තේය.

සුළු හා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක යින්ටත් අපනයන අභිමුඛ නව ව්‍යවසායකයන් සහ අපනයන ක්ෂේත්‍රයේ නව අදහස් දරණ පිරිසටත් මෙම එක්දින වැඩසටහන සුවිශේෂී වේදිකාවක් වනු ඇති බව අපනයන සංවර්ධන මණ්ඩලය පවසන්නේය.

අපනයන ක්‍රියා පටිපාටියණී කෘෂිකාර්මික මෙන්ම කාර්මික නිෂ්පාදන හා සේවා පිළිබඳ තොරතුරුණී නිෂ්පාදන වැඩිදියුණු කර ගැනීමට අදාළ විස්තර, වෙළඳපොළ හඳුනා ගැනීම පිළිබඳ උපදේශන සේවා, අපනයන සම්බන්ධතා ගොඩනගා ගන්නා ආකාරය මෙන්ම අපනයන අභිමුඛ ව්‍යවසායකයින්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීම සඳහා වූ සේවා රැසක් 'EDB Open Day' තුළ අන්තර්ගතය.

අනාගතයේ අපනයනකරුවන් ලෙස ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂිත ඔබගේ නිෂ්පාදන වැඩිදියුණු කර ගැනීමේදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මාර්ගෝපදේශ ලබාදීමද මෙහිදී සිදුවන්නේය. වැඩසටහන සඳහා සහභාගී වන්නන්ට අපනයන සංවර්ධන මණ්ඩලයේ අදාළ නිලධාරීන් මෙන්ම සියලුම සේවාවන් හා එකම පියසකදී පෞද්ගලිකව ලබාගැනීමට මෙහිදී පහසුකම් සලසා ඇත්තේය.

ඊට අමතරව ගැනුම්කරුවන් සහ විභව වෙළඳපොළ සොයා ගැනීම, කාබනික ලියාපදිංචිය, ශ්‍රී ලංකා කුරුඳු සඳහා වෙළඳ ලාංඡන ලබාගැනීම (PCC), ඇසුරුම් මාර්ගෝපදේශය සහ අදාළ පාර්ශ්ව කරුවන්ගේ නියෝජිතායතන වෙත ප්‍රවේශය වැනි සේවාවන් ලබාගැනීම, අපනයන සංවර්ධන මණ්ඩලයේ විවිධ වැඩසටහන් සඳහා ලියාපදිංචි වීම, නව අපනයන සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රවේශය, කාන්තා ව්‍ය වසායකත්ව සංවර්ධන වැඩසටහන සහ අපනයන නාමාවලියට ඇතුළුවීම වැනි සේවාවන් සඳහාද මග සැලසෙන්නේය.

විශේෂිත සැසි සහ එක් එක් අපනයන කරුවන් සමග මුහුණට මුහුණ සාකච්ඡාවන්ද (One-to-One Meeting), අපනයන වෙළඳපොළ අවස්ථා, අපනයන ක්‍රියා පටිපාටිය, කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය සහ ඇසුරුම් කිරීම පිළිබඳ විශේෂිත සාකච්ඡාවන්ද මෙහිදී සංවිධානය කර ඇත්තේය.

එබැවින් සහයෝගීතාව, දැනුම හුවමාරු කර ගැනීම සහ ආර්ථික වර්ධනය සඳහා අපනයන මට්ටමේ ව්‍යවසායකයන්, අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් එකම තැනකදී මුණගැසෙන මෙම අවස්ථාව සුවිශේෂී එකක් වනු ඇතැයි මණ්ඩලයේ අපේක්ෂාව වන්නේය. වැඩසටහන සඳහා උනන්දුවක් දක්වන්නන් අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය ඔස්සේ ලියාපදිංචි වීම අනිවාර්ය වන අතර, එසේ ලියාපදිංචි වූ සෑම අයෙකු වෙනුවෙන්ම හඳුනාගැනීමේ අංකයක් හිමිවන්නේය. www.srilankabusiness.com වෙත පිවිසීමෙන් ලියාපදිංචිය ලබාගත හැකි අතර, එරන්දි 0777238299 / චතුරි 0778281052 / නිපුනි 0718810987 ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීමට හැකියාව ඇත්තේය.

# EDB
# OPEN DAY

**ඔබ අපනයනකරුවෙකු වීමට සිහින දකින්නෙක්ද?**

**මෙය එයට සුදුසුම අවස්ථාවයි**

- නව්‍ය ව්‍යාපාරික අදහසක් තිබේද?
- ආයෝජනය කිරීමට හැකියාවක් ඇත්ද?

අපනයන කිරීම සඳහා සම්පූර්ණ මාර්ගෝපදේශයන් සමඟ ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කරන්න ඔබත් පැමිනෙන්න.




**2023 ජුනි 15 (බ්‍රහස්පතින්දා)**
**උදෑසන 9.30 සිට සවස 4.30 දක්වා**
**EDB පරිශ්‍රයේ දී**

ලියාපදිංචි වන්න

https://bit.ly/3MMYdgg

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# 42 නවම් මාවත, කොළඹ 02.

MINISTRY OF INVESTMENT PROMOTION

EDB SRI LANKA

විමසීම් - එරන්දි (0777238299) චතුරි (0778281052)
නිපුනි (0718810987)
helpdesk@edb.gov.lk
www.srilankabusiness.com



# ඔබත් විදේශගත ගැණුම්කරුවෙක් සොයන ව්‍යවසායකයෙක්ද ?

අපනයන ක්ෂේත්‍රයට ප්‍රවේශ වීමට අපේක්ෂිත බොහෝ ව්‍යවසායකයින්ට ඇති ප්‍රමුඛ ගැටලුව වන්නේ විදේශ ගත ගැණුම්කරුවෙකු සොයා ගන්නේ කෙසේද යන්නය. විදේශ ගත ගැණුම් කරුවෙකු සොයා නොගන්නා තෙක් ඔබට අපනයන කරුවෙකු වීමට නොහැකිය.


මෙය සපුරා ගැනීම වෙනුවෙන් ඔබට කළ හැකි මාර්ග ගණනාවක්ම ඇත්තේය. මෙම ලිපියේ අරමුණ ඒ සඳහා වන එක් ක්ෂේත්‍රක් පිළිබඳ ඔබ දැනුවත් කිරීමය.


ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඔබ වෙත ලබාදෙන සේවා අතර විදේශ ගත ගැණුම්කරුවෙකු ඔබට සොයා දීමද එක් ප්‍රධාන සේවාවක්ය. ඒ යටතේ ඔබගේ නිෂ්පාදනය මිළදී ගැනීමේ විභවයක් සහිත විදේශගත ගැණුම්කරුවන් දස දෙනෙකුගේ සබඳතා මාර්ග සොයා දීම සිදු කෙරෙන්නේය. මෙම සේවාව ඔබ ලබාගත යුත්තේ මාර්ග ගතවය. එනම් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ නිල වෙබ් ද්වාරය වූ **www.srilankabusiness.com** වෙත පිවිසීමෙන්ය. මෙහි පියවරයන් ඉතා සරළය. වෙබ් අඩවියට ඇතුළු වීමෙන් අනතුරුව පළමු රූපයේ සඳහන් For Sri Lankan Exporters වෙත පිවිසණී ඒ යටතේ වන සේවා අතර වන e-Services for Exporters යටතේ ඇති EDB Buyer Search ක්ලික් කිරීමෙන් ගැණුම් කරුවන් ඉල්ලුම් කිරීමට අදාළ මාර්ග ගත අයදුම්පත ලබාගත හැක්කේය.

අනතුරුව එහි සඳහන් තොරතුරු නිසි පරිදි පුරවීම සිදු කළ යුතුය. මේ සඳහා වන ගෙවීම්ද මාර්ග ගත ක්‍රමයට ණය කාඩ් පත් මගින් හෝ බැංකු කාඩ් පත් මගින් සිදුකිරීමට පහසුකම් සලසා ඇත්තේය.

මෙම මාර්ග ගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී ඔබ විසින් අවධානය යොමු කළ යුතු මෙන්ම සපුරා තිබිය යුතු කරුණු ගණනාවක්ද වන්නේය. එම කරුණු ඉතා වැදගත් වන බව සඳහන් කරන්නේ එසේ නොවුණහොත් ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති නිසාය.

මෙහිදී විදේශගත ගැණුම්කරුවන්ගේ තොරතුරු ලබාගැනීමට වන මූලික සුදුසුකම ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය සලකනු ලබන්නේ ඔබගේ ව්‍යාපාරය නිසි පරිදි






ව්‍යාපාර ලියාපදිංචිය ලබා ඇද්ද යන්නය. එය පුද්ගලික සමාගමක් හෝ තනි පුද්ගල / හවුල් ව්‍යාපාරයක් වීම ගැටලුවක් නොවන්නේය. ඔබේ ලියාපදිංචි සමාගමට අදාළව වෙබ් අඩවියක් තිබීම තවත් මූලික අවශ්‍යතාවක් වන්නේය. ඔබේ නිෂ්පාදන පිළිබඳ මෙන්ම සමාගම ගැනත්නී ඊට අදාළ ඡායාරූප මෙන්ම එහි මෙහෙයුම් කටයුතු ගැනත් වෙබ් අඩවියේ සඳහන්ව තිබීම තුළින් විදේශගත ගැණුම්කරුවාට ඔබගේ සමාගම සහ නිෂ්පාදන පිළිබඳ වැඩිදුර තොරතුරු ගවේශනයට රුකුලක් බව සඳහන් කළ යුතුය.

එමෙන්ම ඔබ අප සමග මෙන්ම විදේශගත ගැණුම්කරුවන් සමගද ගණුදෙනු කරන මූලික මාධ්‍ය විද්‍යුත් තැපැලය" ඒ සඳහා කිසිදු අවස්ථාවක gmail, Yahoo, Hotmail, වැනි සමාජ මාධ්‍ය භාවිතා නොකිරීමට ඔබ වගබලා ගත යුතුය. සෑම විටම ඒ සඳහා භාවිතා කිරීමට අප නිර්දේශ කරන්නේ, ඔබගේ සමාගමට අදාළව ලබාගෙන ඇති අන්තර්ජාල ඩොමේන් නම ඇසුරෙන් සකසා ගත් විද්‍යුත් තැපැල් ලිපිනයන්ය. එය ඔබ සහ ඔබේ සමාගම ගැන විදේශ ගත ගැණුම්කරුවාට විශ්වාසනීයත්වය තහවුරු කිරීමට සමත් කරුණක් වන්නේය.

මීට අතිරේකව ඔබගේ නිෂ්පාදන වෙනුවෙන් සමාජ මාධ්‍ය ගිණුම් එකක් හෝ කිහිපයක් සකසා තිබීමද තවත් එක් අවශ්‍යතාවයක් වන්නේය. ඒ සඳහා ෆේස්බුක්, ලින්ක්ඩින්, ට්විටර් වැනි සේවා යොදා ගත හැක්කේය. විදේශ ගත ගැණුම්කරුවන් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීමේදී එම ගැණුම්කරුවන් ඔබට අවශ්‍යවන්නේ ලෝකයේ කුමන කලාප යකින්ද යන්නද තෝරා ගැනීමට මෙහි පහසුකම් සළසා ඇත්තේය. උදාහරණයක් ලෙස ඔබ වෙත ලබා දෙන ගැණුම්කරුවන් යුරෝපයෙන් අවශ්‍යද, ආසියාවෙන් අවශ්‍යද, මැද පෙරදිග කලාපයෙන් අවශ්‍යද, ලතින් ඇමරිකාවෙන් හෝ ඕෂනියාවෙන් අවශ්‍යද යන්න ඔබට තෝරා ගත හැකිය. එසේ නැතිනම් ලොව පැතිරුනු ලෙස පොදුවේ ඉල්ලීමටද පහසුකම් ඇත්තේය.


ඉල්ලුම් කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුකර ඇත්නම්නී ඔබ විසින් මාර්ගගතව ඉල්ලුම් කළ විදෙස් ගැණුම්කරුවන් පිළිබඳ තොරතුරු වැඩකරන දින 07 ක් තුළ ලබාගත හැකිය.

# 2023 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය



2022 වර්ෂයේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 814.1 දක්වා 16.15% කින් අඩු විය. එය 2021 අප්‍රේල් මාසයට සාපේක්ෂව 0.5% ක අඩු වීමකි. ගෝලීය ආර්ථික තත්වය හේතුවෙන් ප්‍රධාන වෙළඳපොළවල ප්‍රධාන නිෂ්පාදන සඳහා නිර්මාණය වු අඩු ඉල්ලුම තවදුරටත් පවතින්නේය.

**රූපය 1: මාසික වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය 2020- අප්‍රේල්, 2023**




(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**2023 අප්‍රේල් මාසයේ ප්‍රධාන අපනයන ධනාත්මක වර්ධනයක් සහිත නිෂ්පාදන සහ සේවා :**

වෙළඳ භාණ්ඩ අපනයනයෙන් 12% ක් වු තේ අපනයන ඉපැයීම් 2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේදී 16.1% සිට ඇමරිකානු ඩොලර් මිලියන 93.39 දක්වා වැඩි විය. තේ පැකට් අපනයනයෙන් ලද ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 47.82 දක්වා 29.1% කින් වැඩි විය.

මීට අමතරව පරිවාරක වයර් (30.43%) සහ අනෙකුත් විදුලි සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන (18.74%) අපනයනවල ශක්තිමත් කාර්ය සාධනයක් සමඟින් 2023 අප්‍රේල් මාසයේදී ඉලෙක්ට්‍රොනික සහ විදුලි උපාංගවලින් අපනයන ආදායම 16.4 % ඇමෙරිකානු ඩොලර් මිලියන 40.01 දක්වා වැඩි විය.

මුහුදු ආහාර අපනයන ආදායම 2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 24.76 දක්වා 17.1% කින් වැඩි විය. ශීත කළ මාළු (21.04%)ණී නැවුම් මාළු (47.9%) සහ ඉස්සන් (0.34%) අපනයනයේ ශක්තිමත් කාර්ය සාධනය මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

තවද විසිතුරු මත්ස්‍ය අපනයන ආදායම 2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 2.12 දක්වා 105.83% කින් වැඩි විය.

කුළුබඩු සහ සාන්ද්‍රිත නිෂ්පාදන අංශයේ අඩුවීමක් වාර්තා වුවද අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේදී කුරුඳු අපනයන ආදායම 8.41% කින් වැඩි විය.

2022 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2023 අප්‍රේල් මාසයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපනයන වටිනාකම 34.95% කින් ඇමරිකානු ඩොලර් මිලියන 529 දක්වා වැඩි වනු ඇතැයි ගණන් බලා ඇත. මීට අමතරව 2022 අප්‍රේල් හා සසඳන විට 2023 අප්‍රේල් මාසයේදී ඉදිකිරීම් සහ මූල්‍ය සේවා අපනයනවල වටිනාකම පිළිවෙළින් 15.71% සහ 3.75% කින් ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත්තේය.

**සේවා අපනයනය :**

2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය සඳහා සේවා අපනයනවල ඇස්තමේන්තු ගත වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 723.68 ක් වු අතර එය 2022 අනුරූප කාල පරිච්ඡේදයට වඩා 9.56% කින් වැඩි වීමකි. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇස්තමේන්ත කර ඇති සේවා අපනයන ICT/BPM ඉදිකිරීම්ණී මූල්‍ය සේවා සහ ප්‍රවාහන සහ සැපයුම් වලින් සමන්විත වේ.

-ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික සැලසුම් අංශය

## වගුව 1: නිෂ්පාදන අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සන්දනය කිරීම (ඇ.ඩො.මි)

| අපනයන භාණ්ඩ | ජන-අප්‍රේල් 2022 | ජන-අප්‍රේල් 2023 | % වර්ධනය (22-23) | අප්‍රේල් 2022 | අප්‍රේල් 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|
| ඇඟලුම් සහ රෙදිපිළි | 1,917.94 | 1,612.24 | -15.94 | 445.78 | 342.81 | -23.10 |
| තේ | 367.21 | 407.66 | 11.02 | 80.44 | 93.39 | 16.10 |
| රබර් ආශ්‍රිත නිෂ්පාදන | 337.57 | 299.02 | -11.42 | 71.28 | 55.40 | -22.28 |
| පොල් ආශ්‍රිත නිෂ්පාදන | 279.43 | 214.19 | -23.35 | 70.72 | 51.61 | -27.02 |
| දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ | 98.20 | 125.24 | 27.54 | 25.49 | 25.25 | -0.94 |
| ඉලෙක්ට්‍රොනික සහ ඉලෙක්ට්‍රොනික සංරචක | 146.73 | 166.81 | 13.68 | 34.45 | 40.01 | 16.14 |
| කුළුබඩු සහ සාන්ද්‍රිත නිෂ්පාදන | 107.11 | 122.62 | 14.48 | 21.52 | 21.08 | -2.04 |
| සැකසූ ආහාර පාන වර්ග | 132.46 | 130.28 | -1.65 | 30.92 | 30.08 | -2.72 |
| මුහුදු ආහාර | 88.95 | 91.50 | 2.87 | 21.23 | 24.86 | 17.10 |
| විසිතුරු මසුන් | 5.83 | 8.70 | 49.23 | 1.03 | 2.12 | 105.83 |
| එළවළු | 7.99 | 9.69 | 21.28 | 1.75 | 2.27 | 29.71 |
| පළතුරු | 10.51 | 13.89 | 32.16 | 2.66 | 3.45 | 29.70 |
| වෙනත් අපනයන බෝග | 23.27 | 14.03 | -39.71 | 8.28 | 6.79 | -18.00 |
| මල් සහ ශාක පත්‍ර | 4.93 | 5.01 | 1.62 | 0.95 | 1.20 | 26.32 |
| බෝට්ටු නිෂ්පාදන | 5.10 | 11.83 | 131.96 | 0.34 | 10.80 | 3076.47 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 65.06 | 140.36 | 115.74 | 4.30 | 13.64 | 217.21 |
| වෙනත් | 626.79 | 438.76 | -30.00 | 149.76 | 89.34 | -40.34 |
| මුළු වෙළඳ භාණ්ඩ අපනයනය | **4,225.08** | **3,811.83** | **-9.78** | **970.9** | **814.1** | **-16.15** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**වගුව 2: ඉහළම අපනයන ගමනාන්ත 15 හි වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| | රට | ජන-අප්‍රේල් 2022 | ජන-අප්‍රේල් 2023 | % වර්ධනය (22-23) | අප්‍රේල් 2022 | අප්‍රේල් 2023 | % වර්ධනය (22-23) |
|---|---|---|---|---|---|---|---|
| 1 | එක්සත් ජනපදය | 1,097.66 | 914.90 | -16.65 | 249.02 | 193.20 | -22.42 |
| 2 | එක්සත් රාජධානිය | 333.40 | 285.74 | -14.30 | 84.14 | 61.44 | -26.98 |
| 3 | ඉන්දියාව | 282.48 | 267.44 | -5.32 | 59.47 | 58.88 | -0.99 |
| 4 | ජර්මනිය | 247.35 | 193.72 | -21.68 | 66.53 | 39.56 | -40.54 |
| 5 | ඉතාලිය | 192.42 | 197.35 | 2.56 | 42.57 | 38.91 | -8.60 |
| 6 | නෙදර්ලන්තය | 130.40 | 106.30 | -18.48 | 27.71 | 22.67 | -18.19 |
| 7 | කැනඩාව | 116.06 | 103.27 | -11.02 | 28.68 | 21.72 | -24.27 |
| 8 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 89.19 | 137.10 | 53.72 | 15.00 | 16.43 | 9.53 |
| 9 | බෙල්ජියම | 95.03 | 72.65 | -23.55 | 25.93 | 16.98 | -34.52 |
| 10 | ප්‍රංශය | 83.74 | 79.82 | -4.68 | 18.84 | 22.52 | 19.53 |
| 11 | ඕස්ට්‍රේලියාව | 78.03 | 73.72 | -5.52 | 19.18 | 17.33 | -9.65 |
| 12 | චීනය | 79.32 | 79.76 | 0.55 | 14.72 | 18.75 | 27.38 |
| 13 | ජපානය | 62.18 | 60.81 | -2.20 | 15.48 | 14.54 | -6.07 |
| 14 | බංග්ලාදේශය | 79.54 | 68.57 | -13.79 | 14.69 | 13.09 | -10.89 |
| 15 | මෙක්සිකෝව | 56.69 | 56.76 | 0.12 | 10.40 | 12.61 | 21.25 |
| 16 | වෙනත් වෙළඳපොළ | 1,201.59 | 1,113.92 | -7.30 | 278.54 | 245.47 | -11.87 |
| | **එකතුව** | **4,225.08** | **3,811.83** | **-9.78** | **970.9** | **814.1** | **-16.15** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව)

**වගුව 3: කලාපය අනුව වෙළඳ භාණ්ඩ අපනයන කාර්ය සාධනය සංසන්දනය කිරීම (ඇ.ඩො.මි)**

| **රට** | **ජන-අප්‍රේල් 2022** | **ජන-අප්‍රේල් 2023** | **% වර්ධනය (22-23)** | **අප්‍රේල් 2022** | **අප්‍රේල් 2023** | **% වර්ධනය (22-23)** |
|---|---|---|---|---|---|---|
| එක්සත් ජනපදය | 1,097.66 | 914.90 | -16.65 | 249.02 | 193.20 | -22.42 |
| යුරෝපා සංගමය (EU) එක්සත් රාජධානිය හැර | 956.94 | 835.07 | -12.74 | 230.91 | 180.24 | -21.94 |
| දකුණු ආසියාව | 425.28 | 392.38 | -7.74 | 86.95 | 83.66 | -3.78 |
| අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) | 282.45 | 333.66 | 18.13 | 56.25 | 59.58 | 5.92 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් | 104.11 | 115.63 | 11.07 | 18.64 | 24.87 | 33.42 |
| අප්‍රිකානු රටවල් | 94.49 | 106.23 | 12.42 | 23.74 | 20.44 | -13.90 |
| මැද පෙරදිග රටවල් (සයිප්‍රසය සහ ඊජිප්තුව හැර) | 67.13 | 81.06 | 20.75 | 11.77 | 20.19 | 71.54 |
| වෙනත් | 1,197.02 | 1,032.90 | -13.71 | 293.62 | 231.92 | -21.01 |
| **මුළු වෙළඳ භාණ්ඩ අපනයනය** | **4,225.08** | **3,811.83** | **-9.78** | **970.90** | **814.10** | **-16.15** |

# අපනයන පුවත්

මාසික තොරතුරු ප්‍රකාශනය

වෙළඳ පහසුකම් සහ වෙළඳ තොරතුරු අංශය,
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
අංක 42 නවම් මාවත,
කොළඹ 02,
ශ්‍රී ලංකාව.

දුරකථන : +94-11-230-0705/11
ෆැක්ස් : +94-11-230-0676

ඊමේල් : tfti@edb.gov.lk
වෙබ් : www.srilankabusiness.com